www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*නව පොතක් එලිදැක්වේ*

# මේරිං බුක්ස් ප්‍රකාශන ආයතනය ඩේවිඩ් නෝර්ත්ගේ "මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය" කෘතිය ප්‍රකාශයට පත් කරයි

## New title now available
## Mehring Books publishes "Marxism, History & Socialist Consciousness" by David North

**2007 අගෝස්තු 17**

*හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. Marxism, History and Socialist Consciousness "(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ එම ග්‍රන්ථයට කතුවරයා විසින් ලියන ලද පෙරවදන පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් පල කරනු ලැබ ඇත.*

2006 මැයි මාසයේ දී වර්කර්ස් ලීගයේ (ඇමරිකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ පෙරගමන්කරු) හිටපු සාමාජිකයෙන් දෙදෙනෙකු වන ඇලෙක්ස් ස්ටයිනර් සහ ෆ්‍රෑන්ක් බ්‍රෙනර් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ න්‍යායික වැඩ කටයුතු, දේශපාලන පිලිවෙත සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිලිබඳව විවේචනයක් පල කලේ ය. *Objectivism or Marxism* (වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද) යන මැයෙන් වූ මෙම ලියවිල්ල ජාත්‍යන්තර කමිටුව තුල පවතින දේශපාලන හා බුද්ධිමය ජීවිතයේ කුනුවන තත්වය ලෙස එහි කතුවරුන් සිතන දෙය සම්බන්ධයෙන් එල්ල කල සිය විවේචනයේ දී අතිශය ක්ෂමා විරහිත විය. කතුවරුන් වර්කර්ස් ලීගයෙන් ඉල්ලා අස්වී ක්‍රියාකාරී විප්ලවවාදී සමාජවාදී දේශපාලනය අතහැර දමා දශක තුනකට ආසන්න කාලයක් ගෙවී ඇත යන කරුන සැලකිල්ලට ගත් කල, ස්ටයිනර්ගේ හා බ්‍රෙනර්ගේ විවේචනවලට ප්‍රතිචාර දැක්වීමට ජාත්‍යන්තර කමිටුවට කිසිදු සුවිශේෂී වගකීමක් තිබුනේ නැත. කෙසේ වෙතත්, අතීතයේ දී බොහෝ විට සිදු වූ පරිදි, මෙම විවේචනය විප්ලවවාදී ඉතිහාසය, මාක්ස්වාදී න්‍යාය සහ සමාජවාදී ක්‍රියාමාර්ගය පිලිබඳ වැදගත් ප්‍රශ්න පැහැදිලි කිරීමෙහි ලා අවස්ථාවක් සම්පාදනය කලේ ය. පෘථුල පිලිතුරක් පිලියෙල කිරීම සඳහා වඩාත් ම බල කල හේතුව වූයේ ස්ටයිනර්-බ්‍රෙනර් ලියවිල්ල, ෆ්‍රෑන්ක්ෆර්ට් ගුරු කුලය හා සමකාලීන නව-මනෝරාජිකවාදය සමග සම්බන්ධිත විවිධාකාර චින්තන ගුරු කුලයන්ගේ ආනුභාවයට ලක් වූ සුලු ධනේශ්වර රැඩිකලුන් අතර ජනප්‍රිය ව්‍යාජ-මාක්ස්වාදී හා සාකල්‍යයෙන් ම ප්‍රතිගාමී සංකල්පවල අව්‍යාජ සාරාංශයක් වීම ය. මුලින් ම 2006 ජූනි 28 දා පල කරන ලද (සමාජවාදී සමානතා පක්ෂයේ සහ ජාත්‍යන්තර කමිටුවේ සාමාජිකයන් හා ආධාරකරුවන් අතර බෙදා හරින ලද) මෙම වෙලුම තුල ඉදිරිපත් කර ඇති ලියවිල්ල වන *Marxism, History and Socialist Consciousness* (මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) ස්ටයිනර්-බ්‍රෙනර් ලියවිල්ලට ජාත්‍යන්තර කමිටුවේ පිලිතුර යි.

*Marxism, History and Socialist Consciousness* ස්ටයිනර් සහ බ්‍රෙනර් වෙත විද්‍යුත් තැපෑලෙන් යවනු ලැබ දැන් හරියට ම වසරක කලක් ගත වී ඇත. එය "පරෙස්සම් සහගත හා සැලකිලිමත් පිලිතුරක් ලැබීමට සුදුසු" එකක් ය යන නිරීක්ෂනය ද සහිතව මෙම ලියවිල්ල ලැබුනු බව ඔවුන්ගේ වෙබ් අඩවියේ සඳහන් කර තිබුනි. කෙසේ වෙතත්, "විප්ලවවාදී ව්‍යාපාරයේ අනාගතයට නොඅඩු දෙයක් එය මත රදා පවතින" බව ප්‍රකාශ කර ඇති ස්ටයිනර් බ්‍රෙනර් තමන්" හදිසි නොවන " බවට ද අනතුරු ඇඟවී ය. අඩු ගනනේ මේ සම්බන්ධයෙන් නම් ඔවුන් තමන්ගේ වචනයට අවංක වී තිබේ. බොහෝ දේවල් ඒ මත රදා පවතින බවට ඔවුන් පවසා ඇති ඔවුන්ගේ පිලිතුර නම් තවමත් මෙලොව එලිය දැක නැත.

එහෙත් ලෝකය ඉදිරියට යයි. ස්ටයිනර් සහ බ්‍රෙනර් ඔවුන්ගේ කල් පසුවුනු ශ්‍රේෂ්ඨතම කෘතිය එලි දැක්වීමට තවමත් හැකියාවක් ඇතත් අපට පෙනී යන්නේ යම් සීමාවකට සමාන අවස්ථාවක් පසු වී ඇති බව යි. *Marxism, History and Socialist Consciousness* මාක්ස්වාදී න්‍යාය සම්බන්ධයෙන් උනන්දු සහගත වඩා පුලුල් ජනකායක අවධානයට ගෙන ඒමෙහි ලා තව දුරටත් බලා සිටීමේ කිසිදු හේතුවක් අපට නොපෙනෙයි. මාක්ස්වාදය ද සුලු ධනේශ්වර රැඩිකල් දෘෂ්ටිවාදයේ විවිධාකර සමකාලීන රූපාකාරයන් ද අතර පවත්නා ප්‍රගාඪ හා සමහන් කල නොහැකි ආගාධය එලිදැක්වීමෙහි ලා මෙම ලියවිල්ල උදව්කාරක වනු ඇත යන්න මාගේ බලාපොරොත්තුව යි.

ඩේවිඩ් නෝර්ත්
ඩෙට්‍රොයිට්
2007 ජූනි 28

© www.wsws.org